(අන්තර්ජාල අනුවාදයකි)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 30 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5. 75 තැපැල් ගාස්තුව: රු. 3.50

**1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 30 වැනි දින.]

එල්. ඩී. - ඕ. 27/98.

## 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1964 අංක 29 දරන පනතේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 12 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

"මණ්ඩලයේ කාර්ය.

12. (1) පහත සඳහන් කරුණු සහ අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා මණ්ඩලය වෙත යොමු කරනු ලබන වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය :-

(අ) රටේ ජල සම්පත් සංරක්ෂණය සහ උපයෝගීකරණය කිරීම ඇතුළත් ඒවා පාලනය කිරීම, විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම ;

(ආ) ගංගා, ඇළ මාර්ග හා වෙනත් ජල මාර්ග අපවිත්‍රවීම වැළැක්වීම ;

(ඇ) පහත සඳහන් අරමුණුවලින් රටේ ජල සම්පත් පාලනය හා පරිහරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම ;

(i) ජල සම්පත් බහු කාර්ය ලෙස සංවර්ධනය හා පරිහරණය කිරීම ;

(ii) ගෘහ කටයුතු හා කාර්මික කටයුතු සඳහා කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව ජල සම්පත් ලබාදීම ;

(iii) ලවණතාව පාලනය කිරීම;

(iv) වෙනත් යම් සමාන අරමුණු ;

(ඈ) රටේ භූගත ජල සම්පත් සංරක්ෂණය, උපයෝගීකරණය, පාලනය හා සංවර්ධනය සඳහා සවිස්තරාත්මක හා එකිනෙක සම්බන්ධ සැලසුම් සකස් කිරීම ;

(ඉ) ජල භූ විද්‍යාව සම්බන්ධව මූලික දත්ත සමීක්ෂණ සහ අනෙකුත් පරීක්ෂණ වලට අනුව රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථාවල ක්‍රියාකාරකම්වල සම්බන්ධීකරණයක් ඇති කිරීම ;

(ඊ) රටේ භූගත ජල සම්පත් සම්බන්ධයෙන් රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා මඟින් සිදු කරනු ලබන පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ, සැලසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම;

(උ) රටේ භූගත ජල සම්පත් සංරක්ෂණයට, උපයෝගීකරණයට සහ සංවර්ධනයට අදාළව රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ එම ව්‍යාපෘති පවත්වා ගැනීමේ හැකියාව, ඵලප්‍රයෝජන සහ ආර්ථික ශක්‍යතාව තක්සේරු කිරීම ;

(ඌ) භූගත ජලය නිසි ලෙස පාලනය හා ආර්ථිකමය පරිහරණය සඳහා රජය විසින් ගත යුතු වන වෙනත් ඕනෑම, සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන්ව ඇති කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීමට අවශ්‍ය දත්ත සහ තොරතුරු රැස්කිරීමට හැකියාව සලසන එවැනි පරීක්ෂණ සහ සමීක්ෂණ, මණ්ඩලය විසින් ආරම්භ කරනු ලැබිය හැකි ය.

(3) මෙම වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සඳහන්ව ඇති කාර්ය සඵල ලෙස ඉටු කිරීමට මණ්ඩලයට හැකියාව සලසන්නා වූ වෙනත් ක්‍රියාකාරකම්, ගෙවීම් සඳහා හෝ වෙනත් ආකාරයකට මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන ක්‍රියාකාරකම්වලට පහත දැක්වෙන දේ ඇතුළත් විය යුත්තේ :-

(අ) භූගත ජල සම්පත් පැවතීම පිළිබඳව හැකියාව අධ්‍යයනය කිරීමේ කටයුතු පවත්වාගෙන යාම ;

(ආ) ගැඹුරු නළ ළිං කෘෂිකාර්මික ළිං සඳහා භූගත ජල ක්ෂේත්‍ර හඳුනා ගැනීමට ජල භූ විද්‍යාත්මක පරීක්ෂණ පැවැත්වීම ;

(ඇ) ගෘහ, කෘෂිකාර්මික හා කාර්මික කටයුතු සඳහා භූගත ජලය ලබා ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රමයට නළ ළිං සවි කිරීම ;

(ඈ) උප පෘෂ්ට භූමි ස්ථරය පරීක්ෂා කිරීම සඳහා බෝර සිදුරු විදීම ;

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ජල සම්පත් මණ්ඩලය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ;

(ආ) ජල සම්පත් මණ්ඩලය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගෙන් ;

(ඇ) සෞඛ්‍යය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකගෙන් ;

(ඈ) දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකගෙන් ;

(ඉ) පළාත් පාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමික ගෙන් ;

(ඊ) පළාත් සභා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඔහුගේ නාමිකගෙන් ; හෝ

(උ) වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ;

(ඌ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ;

(එ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ සභාපතිවරයාගෙන් ;

(ඒ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ගෙන් ;

(ඔ) ඉඩම් කොමසාරිස්වරයාගෙන් ;

(ඕ) මිනුම්පතිවරයාගෙන් ;

(ඕ) ගෙවිජන සේවා කොමසාරිස්වරයාගෙන් ;

(ග) ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ;

(ච) 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ;

(ජ) වන සංරක්ෂකවරයාගෙන් ;

(ට) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකගෙන් ;

(ඩ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරිවරයාගෙන්,

සමන්විත (මෙහි මින් මතු "උපදේශක" කමිටුව යනුවෙන් සඳහන් කරනු ලබන) අන්තර් දෙපාර්තමේන්තු උපදේශක කමිටුව ලෙස හැඳින්වෙන කමිටුවක ජල සම්පත් මණ්ඩලය සතු විය යුතු ය."

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් පන්සියය" යන වචන වෙනුවට "රුපියල් පන්දහස" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත සඳහන් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක් , නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතලවලට කාර්‍යයී වලටසහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ," සහ

(ආ) "පළාත් පාලන සේවාව" යන අර්ථ නිරූපණයේ "පළාත් පාලන සේවා ආඥාපනත" යන වචන වෙනුවට "1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත" යන වචන ආදේශ කිරීමෙන්.

6. මෙම පනතේ උපලේඛනයේ I තීරුවේ සඳහන්ව ඇති විධිවිධානවල, ඒ උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහන් වල සඳහන්ව ඇති වචනය හෝ යෙදුම වෙනුවට, ඒ උපලේඛනයේ III තීරයේ අනුරූජී සටහන්වල සඳහන්ව ඇති වචනය හෝ යෙදුම ආදේශ කිරීමෙන්, ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් විධිවිධාන සංශෝධනය කිරීම.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

| | උපලේඛනය | (6 වන වගන්තිය) |
|---|---|---|
| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* |
| 4 (5) | ලංකා | ශ්‍රී ලංකා |
| 5 (2) | ලංකා | ශ්‍රී ලංකා |
| 9 (2) | භාණ්ඩාගාරයේ ලේකම් | රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| 11 | ලංකා | ශ්‍රී ලංකා |
| 13 | ලංකා | ශ්‍රී ලංකා |
| 14 (4) | ස්ථිර ලේකම් | ජල සම්පත් මණ්ඩලය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| 14 (5) | ස්ථිර ලේකම් | ජල සම්පත් මණ්ඩලය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |
| 17 (3) (ඇ) | සෙනෙට් සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය | පාර්ලිමේන්තුව |
| 19 (1) | සෙනෙට් සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය | පාර්ලිමේන්තුව |
| 19 (3) | සෙනෙට් සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය. | පාර්ලිමේන්තුව |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.